# උඩු සිත හා යටි සිත

උඩු සිත හා යටි සිත අතර ඇති ප්‍රධාන ම වෙනස විඥානයක් ඇතිවීම හා නැතිවීම යැයි සිතිය හැකි ය. සෑම චිත්තයක ම අවිඥානික කොටසක් වේ යැයි සිතිය හැකි අතර ඒ කොටස වඩා වැදගත් කොටස වන්නේ යැයි ද ගතහැකි ය. සෑම චිත්තයකට ම සවිඥානික කොටසක් තිබිය යුතු නො වෙයි. අප නිද්‍රාසිටින අවස්ථාවක ඇතිවන චිත්ත පිළිබඳ ව අපි නොදනිමු. ඒ පිළිබඳ අපි සවිඥානික නො වෙමු. නින්දේ දී අපි සිහින දකිමු. සමහර සිහින ගැන අපට මතකයක් ඇති අතර බොහෝ සිහින ගැන අපට මතකයක් නැතැයි කියැවෙයි.

නිර්වින්දනය කරනුලැබූ අවස්ථාවක අපට වේදනාවක් නො දැනෙයි. එහෙත් අපේ සිත් එවැනි අවස්ථාවන්හි අක්‍රිය යැයි නොසිතිය යුතු ය. නිර්වින්දනය කෙරුණු අවස්ථාවක හෝ නින්දේ දී හෝ අප මියයෑමට හැකි ය. එහෙත් එවැනි අවස්ථාවක දී වුව ද චුති චිත්තය ඇතිවෙයි. චුති චිත්තය නොමැතිව පටිසන්ධි චිත්තය ඇති නො වෙයි. සත්ත්වයාගේ සංසාර ගමන නිර්වින්දනයකිරීමෙන් නැවැත්විය නො හැකි ය.

මනස යනු චිත්ත පරම්පරාව බැවින් මනසෙහි ද අවිඥානික කොටසක් හා සවිඥානික කොටසක් ඇතැයි ගතහැකි ය. මනස, මනස විසින් නිර්මානය කෙරෙන අතර චිත්ත ද මනසේ නිර්මාන බව නැවත නැවතත් අවධාරණය කළයුතු ය. උඩු සිත හෙවත් සවිඥානික සිත ක්‍රියාත්මක නොවන අවස්ථා ඇති බැවින් තොරතුරු ගබඩාකිරීම සිදුවන්නේ අවිඥානික සිතෙහි හෙවත් යටි සිතෙහි යැයි ගැනීම නිවැරදි විය යුතු ය. ඉතා පැහැදිලිවම උඩු සිත හා යටි සිත අතර යම් සම්බන්ධයක් වෙයි. උඩු සිතෙන් යටි සිතට තොරතුරු ගලායෑමක් මෙන් ම යටි සිතෙන් උඩු සිතට තොරතුරු ගලා යෑමක් ද සිදුවෙයි.

අප යම් ප්‍රශ්නයක් විසඳන්නේ, එයට පිළිතුරක් සොයන්නේ උඩු සිතෙන් පමණක් නො වෙයි. අපේ යටි සිත උඩු සිතට වඩා ප්‍රබල ව ඒ කාර්යයෙහි යෙදෙයි. එහෙත් උඩු සිත හා යටි සිත අතර වෙනසක් වෙයි. උඩු සිත බොහෝ අවස්ථාවල ද්විකෝටික න්‍යායට කොටුවන අතර යටි සිත එසේ කොටු නො වෙයි. අප තර්කානුකූල යැයි කියන්නේ ද්විකෝටික න්‍යායට අනුකූල වූ අවස්ථාවලට ය. ද්විකෝටිකයට හසු නොවී, ඒ යොදා නොගෙන අප විසින් කෙරෙන කාර්යයන් වෙයි. ඇතැම්විට එවැනි කාර්යයන් අන්තර්ඥානය (intuition) මැදිහත්වීමෙන් කෙරුණේ යැයි අපි කියමු.

අපි උදාහරණයක් ගනිමු. ඉතාමත් ම තාර්කික විෂය යැයි කියැවෙන, එනම් ද්විකෝටික න්‍යායෙහි දැඩිව ම ගිලී ඇතැයි කියැවෙන ගණිතයෙහි අන්තර්ඥානය වැදගත්වන අවස්ථා බොහෝ වෙයි. ජ්‍යාමිතියෙහි ඇතැම් සාධනයන් සඳහා නිර්මාන අවශ්‍ය වෙයි. මේ නිර්මාන මෙසේ කළ යුතු යැයි අපට කියන්නේ අපේ උඩු සිත ද නැත්නම් යටි සිත ද? එනම් අවිඥානික මනස ද නැත්නම් සවිඥානික මනස ද? අපට යම් නිර්මානයක් කිරීමට අනුබල දෙන්නේ යටි සිත මිස උඩු සිත නො වෙයි. යටි සිතෙන් නිර්මානය ලැබුණු පසු අපි උඩු සිත යොදාගනිමින් ද්විකෝටික න්‍යායට අනුව තර්කානුකූල ව සාධනයක් කරන්නෙමු. එහෙත් සාධනයෙහි පදනම වූ නිර්මානය තර්කානුකූල වූවක් නො වෙයි.

යටි සිතෙන් ලැබෙන අදහස් නොමැතිව ගණිතයවත් කරගෙන යෑමට නොහැකි නම් අන් විෂය ගැන කවර කතා ද? ප්‍රශ්නයක් ඇතිවුණු විට ඒ ප්‍රශ්නය ගැන සිතා නින්දට යෑමෙන් පසුව ඇතැම් අවස්ථාවල ප්‍රශ්නයට පිළිතුරත් සමග නින්දෙන් නැගිටීමේ අත්දැකීම අප සමහරකුට ඇත. මේ සම්බන්ධයෙන් ඉතා ප්‍රසිද්ධ ම උදාහරණය කෙකුලේ හා බෙන්සීන් මුදුව පිළිබඳ කතාව ය. කෙකුලේ නම් විද්වතාට පෙර බටහිර රසායන විද්‍යාවේ අණු රේඛීය හා විවෘත විය. ඒ සැලැස්මට ම බෙන්සීන් අණුව සඳහා ද ආකෘතියක් නිර්මානයකිරීමට බටහිර රසායනික විද්‍යාඥයෝ උත්සාහ ගත්හ. එහෙත් ඒ උත්සාහ සියල්ල ව්‍යර්ථවිය. කෙකුලේ ද මේ ප්‍රශ්නය පිළිබඳව තම අවධානය යොමුකෙළේ ය. ප්‍රශ්නයත් සමග නින්දට වැටුණු ඔහු සිහිනයක් දුටුවේ ය. ඒ සිහිනයෙන් සර්පයකු තමා ම ගිලින ආකාරයක් දක්නට

© Prof. Nalin De Silva

ලැබිණි යැයි කියැවෙයි. බෙන්සීන් අණුවේ ආකෘතිය ද චක්‍රයකට යන තමා තමන් ගිලින සර්පයකුගේ ආකාරයක් නිරූපණය කරයි.

ඒ උදාහරණයෙන් පෙන්නුම් කෙරෙන්නේ උඩු සිත නින්දට ගිය ද යටි සිත නින්දට නොයන බව ය. එමෙන් ම යටි සිත ප්‍රශ්නවලට පිළිතුරු සොයන්නේ උඩු සිත ප්‍රශ්නවලට පිළිතුරු සොයන ආකාරයෙන් ද නො වෙයි. එහි දී යොදාගැනෙන සංකේත ද වෙනස් වෙයි. බෙන්සීන් අණුව සර්පයකු ලෙස ගන්නට යටි සිත පෙළඹී ඇත. යටි සිතෙහි සංකේත අපට බොහෝවිට හඳුනාගැනීමට නො හැකි ය. අපට මතක ඇති සිහින පවා අපේ ජීවිතය සමග ගැටගැසී ඇති ආකාරය අපට බොහෝවිට නො තේරෙයි. අපට මතක නැති සිහින මතක්කරගැනීමේ ක්‍රමයක් වේ නම් රෝගී තත්ත්වයන් ද ඇතුළු අපේ ඇතැම් ප්‍රශ්න විසඳාගැනීමට ඒ කෙතෙක් ඉවහල් වීමට තිබුණි ද? මේ ලිපි පෙළ පිළිබඳව ද යම් වෙනසක් සිදු වී ඇති බව මා ඊයේ දුටු සිහිනයකින් කියැවිණි. ඒ කුමක්දැයි මට එක එල්ලේම කිව නොහැකි වුව ද පුවත්පතේ කතෘතුමාට කතාකිරීමෙන් ඒ පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට හැකිවිය.

බුදුන් වහන්සේ වැඩවිසූ සමයෙහි සිහින තේරීමට දක්ෂ පුද්ගලයන් ද සිටි බව පැහැදිලි ය. සිදුහත් කුමරු මව්කුස පිළිසිඳගත් අවස්ථාවෙහි දුටු සිහිනය තේරුම්කර දීමට සමත්වුවෝ එකල දඹදිව විසූහ. කොසොල් රජු දුටු සිහින බුදුන්වහන්සේට ද යොමුවිණි. සිහිනයක උඩු සිතෙහි සංකේත බොහෝවිට යොදා නොගැනීම නිසා සිහින තේරුම්කිරීම එයට ම ආවේණික වූ ශාස්ත්‍රයක් බවට පත්වෙයි. අවුරුදු දහස් ගණනකට පෙර අප රටවල තිබූ සිහින පිළිබඳ දැනුම වැන්නක් ගොඩනගාගැනීමට බටහිරයන් උත්සාහකරන්නේ දැනට අවුරුදු සියයකට පමණ පෙර සිට ය.

එහෙත් බටහිරයන් සිහිනය ද පසුකර කෙලින්ම යටි සිතට යෑමට උත්සාහ දරණ බව බටහිර මනෝවිශ්ලේෂකයන් යැයි කියන්නන්ගේ ක්‍රියාවලින් පෙනී යයි. අපට මේ සම්බන්ධයෙන් කළහැකි දෑ බොහෝ වෙයි. සිංහල බෞද්ධයෝ යටි සිත ගැන බොහෝ කලක සිට කතාකරති. අප යටි සිතක් ඇති බව දැන බොහෝ කල් ය. පරචිත්තවිජානන ඥානයක් ගැන ද අපි දනිමු. අප එකල මේ දැනුම් ලබාගත්තේ භාවනාවෙන් හා ධ්‍යාන මගින් විය හැකි ය. අප නැවතත් භාවනාව හා ධ්‍යාන සසරින් එතරවීමේ මගක් ලෙස ම දැනුම ලබාගැනීමේ හා නිර්මානයකිරීමේ මගක් ලෙස ද වර්ධනය කළයුතු ය. එමෙන් ම අධ්‍යයනික කටයුත්තෙක් ලෙස ද, එනම් ධ්‍යානික නොවන කටයුත්තක් ලෙස ද, සුළුවෙන් හෝ යටි සිත ගවේෂණයට අප යොමු වියයුතු ය. අප එහි දී බටහිරයන් පසුපස යායුතු නොවන බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. අනෙකකුගෙන් තොරව තමා හඳුනාගත නොහැකි බටහිරයන්ගෙන් අපට මනෝවිශ්ලේෂණයේ දී ඉගෙනීමට ඇත්තේ කුමක් ද?

සිංහල භාෂාවෙහි සිතනවා හා සිතෙනවා යනුවෙන් වචන දෙකක් ඇත. මා සිතනවා යන්නෙන් කියැවෙන්නේ මා දැනුවත් ව, එනම් සවිඥානික ව කරන සිතීම ය. එසේ නම් මට සිතෙනවා යනුවෙන් කියැවෙන්නේ කුමක් ද? ඉතා පැහැදිලිව ම ඒ වෙනත් අයකුගේ සිතීමක් නො වෙයි. සිතෙන්නේ අන් සිතකට නොව යටි සිතට ය. මට සිතෙනවා යන්නෙහි තේරුම මගේ යටි සිතට සිතෙනවා යන්න ය. ඒ අවිඥානික සිතීමකි. මනස "දැනුවත් වීමෙන්" තොරව කෙරෙන සිතීමකි. එය කරන සිතීමක් නොව කෙරෙන සිතීමකි. යටි සිතට සිතෙන දෑ උඩු සිතට දැනුම්දීමේ ක්‍රමයක් ද වෙයි. නිදාගැනීමේ දී නිර්වින්දනය කෙරුණු අවස්ථාවක දී වැනි අවස්ථාවලින් බාහිර ව ගතහොත් චිත්තයක උඩු සිත මෙන් ම යටි සිත ද ක්‍රියාත්මකවන බව අමතක නොකළ යුතු ය.

මෙහි දී ඉතා වැදගත් කරුණක් නොකියා ම බැරි ය. කර්මය බලපාන්නේ සවිඥානික ක්‍රියා හා සම්බන්ධයෙන් ය. මට සතකු මැරීමට සිතෙනවා විය හැකි ය. එහෙත් මා ඒ සතා දැනුවත් ව නොමැරුවහොත් මට ඉන් අත්වන දුගතියක් නැත. බුදුන් වහන්සේ මෙවැනි කරුණු ඉතා මැනවින් පහදා දී තිබිය දී අපට අපේ ම වූ වර්ධනය වූ මනෝ විශ්ලේෂණයක් අවුරුදු දහයක් පමණ වූ ඉතා සුළු කාලයක දී ගොඩනගාගත හැකිවිය යුතු ය. ධ්‍යානය නැති අධ්‍යයනය යටි සිත තේරුම්ගැනීමට ප්‍රබල මාධ්‍යයක් යැයි මට නො සිතෙයි. එනම් මගේ යටි සිතට නො සිතෙයි. අපේ දරුවන්ට දැනුම ලබා දීමේ දී පාසල්වල බැරිනම් දහම්පාසල්වල හෝ ධ්‍යානික ක්‍රම ගැන අවබෝධයක් ලබාදිය යුතු ය. එහෙත් එය ආවට ගියාට කරන්නක් නොව යම් පදනමක් මත ක්‍රමානුකූල ව කළයුත්තක් වෙයි. දහම්පාසල ධ්‍යානික දැනුම ලබාගන්නා ආයතනය බවට ක්‍රමයෙන් සකස්කරගත හැකි ද?

© Prof. Nalin De Silva

මගේ යටි සිතට සිතෙන ඒ සිතිවිල්ල උඩු සිත වහල්කරමින් ද්විකෝටික න්‍යායික ව (logically) ඉදිරිපත්කරන්නේ කෙසේ ද? ඕනෑම ප්‍රවාදයක උපකල්පන තිබෙන බව අමුතුවෙන් කදවයුතු නො වෙයි. උපකල්පන නොමැති ප්‍රවාදයක් ලොවෙහි නැත. අද බටහිරයෝ සියල්ල සඳහා වූ ප්‍රවාදයක් (Theory of Everything) නිර්මානයකිරීමට වෙහෙසෙති. එහෙත් එය කිසි දිනෙක කළ හැක්කක් නො වෙයි. එයට හේතුව උපකල්පන නොමැති ප්‍රවාදයක් නොමැති වීමත් ඒ උපකල්පන අදාළ ප්‍රවාදයෙන් තේරුම්කිරීමට නොහැකිවීමත් නිසා ය. සියල්ල සඳහා වූ ප්‍රවාදය උපකල්පන නොමැති ප්‍රවාදයක් වියයුතු ය. ඕනෑම වචනයක යම් උපකල්පනයක් ඇති බැවින් වචන භාවිතයෙන් සියල්ල සඳහා වූ ප්‍රවාදය නිර්මානය නො කළහැකි වෙයි.

මගේ ප්‍රවාදයෙහි පදනමෙහි වන්නේ උඩු සිත හා යටි සිත යනුවෙන් කොටස් දෙකක් ඇති බවත් ඒ කොටස් දෙක අතර සන්නිවේදනයක්, තොරතුරු හුවමාරුවක් ඇති බවත් ය. ඒ අතර උඩු සිත හා යටි සිත ක්‍රියාකරන ක්‍රම අතර වෙනසක් ඇතැයි යන්න ද එහි උපකල්පනය කෙරෙයි. උඩු සිත බොහෝවිට ක්‍රියාත්මකවන්නේ අනෙක් ඉන්ද්‍රිය ද සමගින් ය. ඒ ඉන්ද්‍රිය ක්‍රියාත්මකවන්නේ ද්විකෝටික න්‍යායට වහල් ව බැවින් උඩු සිත ද බොහෝවිට ද්විකෝටික න්‍යාය අනුගමනය කරයි. එහෙත් යටි සිතට  එවැනි බැමි නැත. එයට න්‍යායක් යැයි කිවහැකි දෙයක් නැති තරම් ය.

උඩු සිතට තේරුම්ගත හැක්කේ සීමිත ලෝකයකි. ඒ ඉන්ද්‍රිය ගෝචර ලෝකයයි. මෙහි දී තේරුම්ගැනීම යන්නෙන් අදහස්කෙරෙන්නේ වචනවලින් හැඟීම්වලින්, චිත්‍ර හා සංගීතය වැනි වචන නොවන වෙනත් සංකේතවලින් ආකෘති හා ඇතැම්විට සංකීර්ණ ප්‍රවාද ඇසුරෙන් තමන් නිර්මානයකරන ලෝකය විස්තරකිරීම ය. යටි සිතට වචන අවශ්‍ය නො වෙයි. යටි සිතෙහි සංකල්ප නැති බවක් මින් නො කියැවෙයි. යටි සිතෙහි සංකේත ද වෙයි. එහෙත් ඒ සංකේත ඉන්ද්‍රිය ගෝචර ලෝකයේ සංකේතවලට වඩා වෙනස් ය. උඩු සිතෙහි සාමාන්‍ය මිනිසකුට අඩි හයකට වඩා උස වැටක් උඩින් පැනීමට නො හැකි ය. එහෙත් යටි සිතෙහි එවැනි බාධාවක් නැත. එහි වැට වැටක් නොවන අතර ගුරුත්වාකර්ෂණයක් ද නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva